කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය
பெண்கள் மற்றும் ஊடகக் கூட்டமைப்பு
Women and Media Collective
Established 1984

**යෝජිත කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාල පනත් කෙටුම්පත සහ විශ්වවිද්‍යාල පනත සඳහා යෝජිත සංශෝධන පිළිබඳ ප්‍රකාශය**

කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය
2021 අගෝස්තු

සම අවස්ථා සහ ප්‍රජාතාන්ත්‍රික අයිතීන් වෙනුවෙන් පෙනී සිටිමින් කටයුතු කරන සිවිල් සමාජ සංවිධානයක් වශයෙන්, යෝජිත කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාල පනත් කෙටුම්පත සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සඳහා යෝජිත සංශෝධන පිළිබඳ අපගේ මතය ඉදිරිපත් කිරීම අපගේ කාර්යය වන බව, කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය, වන අප විශ්වාස කරන්නෙමු.

**අධ්‍යාපනය මිලිටරීකරණය කිරීම**

හමුදා කාර්ය මණ්ඩලයක් විසින් මෙහෙයවනු ලබන උසස් අධ්‍යාපන ක්‍රමයක් පිහිටුවීමට කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාල පනත් කෙටුම්පත මගින් යෝජනා කෙරේ. සත්‍ය වශයෙන්ම, උපකුලපතිවරයා ඇතුළුව මණ්ඩල සාමාජිකයින්ගෙන් පස් දෙනෙකුම සක්‍රීය හමුදා සේවයේ නියුතු නිලධාරීන් වේ. මෙම විශ්වවිද්‍යාල ක්‍රමය එක්තරා ආකාරයක චින්තනයක් මගින් පමණක් පාලනය කරනු ලැබෙන බව අසත්‍යයක් ලෙස ඉවතලිය නොහැක්කකි. ප්‍රජා පරිපාලනමය භූමිකාවන් පිරවීම සඳහා විනයගරුක පුරවැසියන් බිහි කිරීමේ අවශ්‍යතාවය සහ මෙම පසුබිම තුල, අනිවාර්යයෙන්ම නියෝග පිළිපදින්නන් බිහි කිරීම රජය විසින් අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකාවේ භාරදූර පරිපාලන තනතුරු සඳහා හමුදා සහ බුද්ධි අංශ නිලධාරීන් 28 දෙනෙකු පත් කිරීමත් සමග ප්‍රජා කටයුතු මිලිටරිකරණය වීම වැඩි වී ඇත. යුද හමුදාපතිවරයා කොවිඩ්-19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානයේ ප්‍රධානියා වීමත් සමග කොවිඩ්-19 ට එරෙහි ක්‍රියාන්විතය ද තදින්ම මිලිටරීකරණය වී ඇත.

එබැවින් සිවිල් පරිපාලනයේ වැඩි කොටසක් හමුදාව යටතට ගෙන ඒමට රජය විසින් දක්වන උනන්දුව පිළිබඳ අප අවධානයෙන් සිටින්නෙමු.

වර්තමාන කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල පනතෙහි නිදහස් අදහස් ප්‍රකාශ කිරීම සහ විරුද්ධ මත දැරීම සඳහා වන ශිෂ්‍යයින්ගේ අයිතිය මැඩපැවැත්වීම සඳහා විධිවිධාන අන්තර්ගත වේ. මෙය හමුදා පුහුණුවේ කොටසක් විය හැකි අතර එය නිදහස් චින්තනය පෝෂණය කිරීම ඉතා වැදගත් දෙයක් වන සිවිල් උසස් අධ්‍යාපනය සඳහා නුසුදුසු වේ.

**විනයගරුක පුරවැසියා**

කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාල පනතේ විධිවිධානවල අවශ්‍යතාව පැහැදිලි කිරීමක් ලෙස, ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය යනු, "මේ වන විට රැකියා වෙළෙඳපොළට ගැලපෙන විනයගරුක ශිෂ්‍ය පරම්පරාවක් බිහිකරමින් සිටින, දෙමාපියන් සහ ශිෂ්‍යයින් ඇතුළු සමාජයේ ඉහළ ඉල්ලුමක් පවතින අතර,

56/1, සරසවි මාවත, කාසල් වීදිය, කොළඹ 8, ශ්‍රී ලංකාව
சரசவி லேன், காசல் வீதி, கொழும்பு 8, இலங்கை.
Sarasavi Lane, Castle Street, Colombo 8, Sri Lanka

Telephone: +94-11-2690192, 5632045, 5635900, 5635800, 2690201, Fax: +94-11-2690192, 2690201, Email: wmcsrilanka@gmail.com
www.womenandmedia.org facebook.com/womenandmediacollective twitter.com/womenandmedia

Registration No. GA 2476

නිශ්චිත කාලයක් තුළ පාඨමාලා නිම කිරීම මෙයට ප්‍රධානතම එක් හේතුවක් වන'' විශ්වවිද්‍යාලයක් වශයෙන් ප්‍රකාශ කොට ඇත.
අප පළමුවෙන්ම සැලකිලිමත් වන්නේ විනය ගැන සඳහන් කිරීමෙනි, එයින් අදහස් කරන්නේ ආයතනය විසින් බිහි කිරීමට අදහස් කරන පුරවැසියන්ගෙන් මිලිටරිකරණය වූ විනයක් අපේක්ෂා කරන බවයි.හමුදා විනය යනු පුරවැසියන් හා තරුණයින්ගේ අවශ්‍යතාවයෙන් වෙන් වූ වෙනම තත්ත්වයකි. කිසිවකට විරුද්ධ නොවන පුරවැසියෙකුගේ අච්චුවකට ගැලපෙන පරිදි ශිෂ්‍යයන්ගේ උසස් සහ නිදහස් චින්තන මනස යටපත් නොකළ යුතුය.

1943 C. W. W. කන්නංගර කමිටුව විසින් ඉදිරිපත් කළ වාර්තාවෙන් අධ්‍යාපනය පිළිබඳ දැක්මක් සහිත ස්ථාවරයක් ප්‍රකාශ කෙරේ.අධ්‍යාපන ක්‍රමය,"පුද්ගලයාට ඔහුගේ ධනය හෝ සමාජ තරාතිරම නොසලකා තමාට හැකි උපරිම ශාරීරික, මානසික හා සදාචාරාත්මක වර්ධනයන් ළඟා කර ගැනීමට උපකාර විය යුතු බවත් දෙවනුව, තම අධ්‍යාපනයේ ප්‍රතිඵලයක් වශයෙන් පුද්ගලයාට හැකි උපරිම අයුරින් ජාතියේ යහපත සඳහා සිය හැකියාවන් භාවිතා කිරීමට හැකි විය යුතු අතර රජයේ කටයුතු පිළිබඳ තම විනිශ්චය ලබා දීමටත් රජය විසින් ඔහුට ලබා දී ඇති ඡන්ද බලය බුද්ධිමත් ලෙස භාවිත කිරීමටත් හැකියාව ලබා දෙන්නක් විය යුතු බවත්'' වාර්තාවේ සඳහන් වේ. එමනිසා, අධ්‍යාපනය එහි නියම ආකාරයෙන්ම, බුද්ධිමත් හා ස්වාධීන පුරවැසියන් පෝෂණය කළ යුතු අතර එම පුරවැසියන් හුදෙක් නියෝග ක්‍රියාත්මක කිරීමට පමණක් සැදී පැහැදී සිටින්නවුන් නොවිය යුතු ය.

අමාත්‍යවරයාගේ ප්‍රකාශයේ දෙවන කොටසද ව්‍යාකූල සහිත ය, මන්ද,මිලිටරිකරණය වූ අධ්‍යාපන ක්‍රමය රාජ්‍ය විශ්ව විද්‍යාලවල අකාර්යක්ෂමතාවයන් ජය ගැනීමේ මාර්ගයක් ලෙස රජය විසින් සලකනු ලබන බවක් ඉන් පෙනී යයි. කෙසේ වුවදකොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලය ගෙවන විශ්ව විද්‍යාලයක් වන අතර එමඟින් දැනටමත් එය වෙනස් කොට සැලකෙන අධ්‍යාපන ක්‍රමයක් බවට පත් කරයි. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවතින වර්තමාන විශ්ව විද්‍යාල පද්ධතිය තුළ හඳුනාගෙන ඇති කිසිදු ගැටළුවක් සඳහා එයින් විසඳුම් නොලැබේ. වර්තමාන විශ්ව විද්‍යාල පද්ධතිය වඩාත් කාර්යක්ෂම කිරීමට කටයුතු කරනවා වෙනුවට රජය විසින් ඉක්මන් විසඳුමක් හඳුන්වා දීමට උත්සාහ කරන බවක් ඉන් පෙනේ.

**විශ්වවිද්‍යාල පනත සංශෝධනය කිරීම**
කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාල පනත් කෙටුම්පතට එරෙහි විරෝධය හමුවේ රජය විසින් හදිසියේම 2021 ජූලි මාසයේදී විශ්ව විද්‍යාල පනත සඳහා සංශෝධන ගැසට් කරනු ලැබීය. මෙම නව සංශෝධනය මගින් "නිශ්චිතඅරමුණක් සඳහා විශ්ව විද්‍යාලයක්" පිහිටුවීමට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට අවසර ලබා දේ. මෙම සංශෝධනය ගෙන ආ පසුබිම තුළ සහ කාලය තුළ, මෙය කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලයවිශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතට ගෙන ඒම සඳහා ගත් නිෂ්ඵල උත්සාහයක් බව නිගමනය කිරීමට අපට පොළඹවයි.

මෙම විද්‍යාපීඨය සිවිල් ශිෂ්‍යයින්ට විවෘත කිරීම සඳහා වන මෙම නව පනත් කෙටුම්පතේ විධිවිධාන තුළින් කැඩෙට් භටයින් සඳහා විද්‍යාපීඨයක් වශයෙන් තිබූ කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේවිශේෂ කාර්යය හෝ 'නිශ්චිත අරමුණ' ඔවුනට අහිමි වී තිබේද යන්න සලකා බැලීම අවශ්‍ය කරුණකි.එක්කෝ තරුණ කැඩෙට් භටයින් පුහුණු කිරීමේ නිශ්චිත අරමුණ ඇතිව උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස පැවතීමකොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලයවිසින් නවත්වනු ඇත, නැතහොත් රජය විසින් මෙම සංශෝධනය තුළින් කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලයේ අරමුණ මිලිටරිකරණය වූ අධ්‍යාපනයක් බව පිළිගනු ඇත. මිලිටරි අධ්‍යාපනය අධීක්ෂණය කිරීමේ බලය සහ නිපුණතාවය විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට තිබේද යන්න ගැටලුවකි.



Women and Media Collective
Established 1984

එම නිසා මෙම තීරණ වල තාර්කිකත්වය සහ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනයේ අනාගතය සඳහා මෙම රජය සතුව ඇති දැක්ම පිළිබඳව අපි ප්‍රශ්න කරන්නෙමු. මේ සම්බන්ධයෙන් සිදු කරනු ලබන යම් වෙනස්කමක් අධ්‍යාපනඥයින් හා ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සමඟ සාකච්ඡා කිරීමේ ක්‍රියාවලියකින් පසුව සිදු විය යුතු යැයි අපි තරයේ විශ්වාස කරන්නෙමු.